කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
**University of Kelaniya - Sri Lanka**

බාහිර විභාග අංශය
External Examinations Branch

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්
**Bachelor of Arts (General) Degree Third Examination (External) – 2009**
**August / September 2010**

සමාජීය විද්‍යා පීඨය
**Faculty of Social Sciences**

මනෝවිද්‍යාව - PSYC - E3025
**Psychology – PSYC- E3025**

සෞඛ්‍ය මනෝවිද්‍යාව
# Health Psychology

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න
Answer four (04) questions only

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි
**No. of questions : 10**

කාලය : පැය 03 යි
**Time : Three hours**

---

01. "විෂබීජ හා බාහිර අනතුරුවලින් ආරක්ෂාවීම පමණක් සෞඛ්‍ය සංකල්පයට සීමා කළ නොහැකිය." සෞඛ්‍ය පිළිබඳ නවීන මතවාද ඇසුරෙන් විමසන්න.

"The concept of health could not be restricted to the mere protection from germs and injuries." Review this statement in relation to modern concepts of health.

02. සෞඛ්‍ය පිළිබඳ ජීව මනෝවිද්‍යා ආකෘතියේ ඓතිහාසික විකාශය විස්තර කරමින් සෞඛ්‍ය මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කෙටියෙන් දක්වන්න.

Describe the development of biopsychological model of health and explaim the scope of Health Psychology.

03. ස්නායු පද්ධතියේ ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය සැකෙවින් විස්තර කරමින් ඒ ආශ්‍රිත ඓන්ද්‍රිය ආබාධ දෙකක් විස්තර කරන්න.

Describe in brief the structure and function of the nervous system and explain two organic illnesses related to it.

04. ක්ලමථ සංකල්පය ඇසුරෙන් 'ප්‍රයෝජ්‍ය ක්ලමථය', 'හානිකර ක්ලමථය', හා 'ක්ලමථ වර්ගීකරණය' යන සංකල්ප විස්තර කරන්න.

Discuss 'Ustress', 'Distress' and 'stress classification' within the framework of the concept of stress.

05. "ක්ලමථය නිහඬ ඝාතකයෙකි." ක්ලමථයෙහි ජෛව රසායනික පදනම ඇසුරෙන් විමසන්න.

"Stress is a silent killer." Review this statement with reference to the biochemical basis of stress.

06. එක්කෝ හෘදයාබාධ නැතහොත් අධිරුධිර පීඩනය කෙරෙහි බලපාන මනෝවිද්‍යාත්මක හේතු සාධක පරීක්ෂා කරන්න.

Investigate the psychological basis of <u>either</u> cardiovascular disease <u>or</u> hypertension.

07. බෝ නොවන රෝග පාලනයේදී නූතන කාර්මික සමාජ වටිනාකම් වෙනුවට සම්ප්‍රදායික සමාජ වටිනාකම් ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

Discuss the importance of replacing the modern industrial social values with traditional social values in controlling non-epidemic illnesses.

08. ළමා වියෙහි පෞරුෂ ගැටළු පසුකාලීන මානසික සෞඛ්‍ය කෙරෙහි බලපාන ආකාරය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

Explain with examples how the childhood personality disturbances affect the adulthood mental health.

09. රෝගියා කෙරෙහි වෛද්‍යවරයා සතු සදාචාරාත්මක බැඳීම විමර්ශනය කරන්න.

Examine the moral responsibility of the doctor towards his/her patient.

10. නූතන මිනිසාට මරණය වේදනාකාරී අත්දැකීමක් වී තිබෙන්නේ ඇයි? මනෝවිද්‍යාත්මක දෘෂ්ටියෙන් පිළිතුරු සපයන්න.

Why has death become a painful experience to the modern man? Answer from a psychological viewpoint.

**********************************